RARE

# ඉඩම් හිමිකම් හා ඉඩම් සංවර්ධන ගැටළු.

## ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින් අධ්‍යයනයකි.

RECEIVED
24 JAN 2017
Faculty of ... Studies
University of Kelaniya

කේ. පී. රම්‍යලතා

**(FGS/G/MMSc/2007/09)**

සාමාජීය විද්‍යාපති භූගෝල විද්‍යාව උපාධියෙහි අවශ්‍යතාවක් පූර්ණය කරනු පිණිස

කැළණි විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධනයකි.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 1294 |
| වර්ග අංකය | |



2010 ජූලි

# නිබන්ධන සාරාංශය

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයෙහි භූගෝල විද්‍යාව පිළිබද සමාජීය විද්‍යාපති උපාධිය සම්පූර්ණ කිරීම සඳහා සකස් කරන ලද මෙම පර්යේෂණ නිබන්ධනය "ඉඩම් හිමිකම් හා ඉඩම් සංවර්ධන ගැටළු " පිළිබඳව අධ්‍යයනය කරන ලද්දකි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පදනම් කරගෙන සිදුකරන ලද මෙම පර්යේෂණය තුළ නොදියුණු මිනිසාගේ සිට වර්තමාන දියුණු මිනිසා දක්වා ඉඩම් හිමිකම් සම්බන්ධයෙන් පැවතියා වූ හා දැනට පවත්නා වූ අර්බුදයන් මෙන් ම ඒවා පදනම් කරගෙන ඉඩම් සංවර්ධන ක්‍රියාවලියේ සිදුවී ඇති වෙනස්කම් සම්බන්ධයෙන් අධ්‍යයනයක යෙදුණකි.

සියලුම ජීවී හා අජීවී වස්තූන්ගේ පැවැත්ම සඳහා බලපානු ලබන ප්‍රධාන සාධකය භූමියයි.භූමියෙහි වටිනාකම අතීතයේ සිට වර්තමානය දක්වාම එකසේ පවතින්නකි. එමෙන් ම විකල්ප නොමැති හිඟ සම්පතක් වශයෙන් ද භූමිය හඳුනාගත හැකි ය.මිනිසා හා භූමිය අතර ඇත්තේ අනුයෝජනීය සම්බන්ධතාවයකි. මුල් කාලීන මිනිසා සාමූහිකව ඉඩම් පරිහරණය කළ අතර පසුකාලීනව විවිධ හේතූන්ගේ ප්‍රතිඵල මත ඉඩම් පෞද්ගලික පරිහරණයක් දක්වා පරිවර්තනය විය. ඒ නිසාම ඉඩම්වල හිමිකම් සම්බන්ධයෙන් විවිධ වූ ගැටළු මතුවන්නට විය. මෙම ගැටළු හේතුකොටගෙන ඉඩම් වලින් ලබාගත හැකි සංවර්ධනයට විවිධාකාර බාධාවන් පැමිණ තිබේ. අධ්‍යයනය සඳහා යොදාගන්නා ලද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් හිමිකම් හා ඉඩම් සංවර්ධන ගැටළු හඳුනාගැනීමේ දී ප්‍රාථමික දත්ත මෙන් ම ද්විතීක දත්ත ද උපයෝගී කරගත් අතර ද්විතීක දත්ත යටතේ උක්ත ගැටළුව සම්බන්ධයෙන් මීට පෙර ප්‍රකාශිත කෘති, සඟරා , මෙන් ම ආයතන , අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු කෘති උපයෝගී කරගන්නා ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී ස්ථරායන නියදි ක්‍රමය උපයෝගීකර ගනිමින් නියදිය තෝරාගත් අතර ක්ෂේත්‍රයේ දී ඉඩම් භුක්තිකරුවන් සමීක්ෂණයට ලක්කරන ලද්දේ සසම්භාවී ආකාරයට ය. ඒ තුළින් ලබාගන්නා ලද ප්‍රාථමික දත්තයන් සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම , සටහන් ක්‍රම, ප්‍රස්තාර හා ප්‍රතිශත අගයන් මගින් ඉදිරිපත්කර තිබේ.

ක්ෂේත්‍ර සමීක්ෂණයේදී ලබාගන්නා ලද තොරතුරු විශ්ලේෂණයට අනුව නිගමන කීපයකට එළඹීමට පර්යේෂකයාට හැකිවිය. එහිදී ප්‍රධාන නිගමනය වූයේ ඉඩමක හිමිකම ඉඩම භුක්තිවිඳින පුද්ගලයාට නොමැති වීම ඉඩම් සංවර්ධනය අඩාල කිරීම කෙරෙහි සෘජු බලපෑමක් සිදුකරනු ලබන බවයි. ඵලදායි ලෙස ඉඩම් සංවර්ධනය නොකිරීම කෙරෙහි ඉඩමේ හිමිකම නොමැතිවීමට අමතරව ප්‍රදේශයේ පවත්නා වූ ජල අපහසුතාවන්, කාලගුණික දේශගුණික තත්ත්වයන්, පාංශු ව්‍යුහයන්, තාක්ෂණික ක්‍රම ශිල්පයන් පිළබඳ අනවබෝධය වැනි හේතූන් ද බලපා තිබේ. හිමිකම් නොමැතිව අනවසරයෙන් ඉඩම් භුක්තිවිඳින්නන් අධ්‍යයන ප්‍රදේශය තුළ සැලකිය යුතු ප්‍රමාණයක් ජීවත් වන අතර ඒ තුළින් ඉඩම් කළමණාකරණ ගැටළු මතුවී තිබේ. ඉඩම් සංවර්ධනයේ දී දැකිය හැකි පොදු දුර්වලතාවයන් හා ඒවා මගහරවා ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් ද පර්යේෂකයා පර්යේෂණයේ දී අවධානය යොමුකර තිබේ.

මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය මගින් පර්යේෂණ සම්බන්ධයෙන් හඳුන්වාදීමක් සිදුකර තිබේ. එහිදී අධ්‍යයනය කුමක්ද යන්න සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් අධ්‍යයන ගැටළුව සම්බන්ධයෙන් මෙන්ම අධ්‍යයන අරමුණු ද සාකච්ඡා කර ඇත. ප්‍රාථමික දත්ත රැස්කිරීම, ද්විතික දත්ත රැස්කිරීම, දත්ත විශ්ලේශණය වැනි කරුණු සම්බන්ධයෙන් පළමු පරිච්ඡේදයේදී අධ්‍යයනයට ලක් කර ඇත. දෙවන පරිච්ඡේදයේ දී ඉඩම් හිමිකම සම්බන්ධයෙන් අධ්‍යයනය කර තිබේ. තුන් වන පරිච්ඡේදයෙන් අධ්‍යයන ප්‍රදේශයේ සමාජ ආර්ථික පසුබිම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කර තිබේ.එහිදී අධ්‍යන ප්‍රදේශයේ පිහිටීම, ඉඩම් හිමිකම් හා ඉඩම්වල භුක්තියේ ස්වරූපය, භූමි පරිභෝග රටාව, පුද්ගලයින් වෙත ඉඩම් හිමිකම් ලබා දී ඇති ආකාරය ආදී ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. සිව්වන පරිච්ඡේදය මගින් දත්ත හා තොරතුරු විශ්ලේශණය කිරීම සිදු කර ඇත. මෙහිදී නියැදිය මගින් රැස්කරගන්නා ලද තොරතුරු විශ්ලේශණය කිරීම සිදුකර ඇත. අවසාන පරිච්ඡේදයේදී අධ්‍යයනයේදී හඳුනාගත් ගැටළු සඳහා නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම පර්යේෂණය තුළින් ඉඩම් හිමිකම් සම්බන්ධයෙන් පවත්නා වූ ගැටළු නිරාකරණය කිරීමේ දී හා ඉඩම් සංවර්ධනය ක්‍රියාවලියට යොදා ගැනීමේ දී පවත්නා බාධාවන් මගහරවා ගැනීමට සුළුවෙන් හෝ අනුබලයක් වේයැයි අපේක්ෂා කරමි.